

# අඳුන් සිහින 14

හේමමාලා හේරත් ලියන නවකතාව

*මෙතෙක් කතාව*

*රිදීමා, මහීකා, රුචිරා සහ අමා ශ්‍රී ලංකාවේ සිට මෙල්බර්න් කරා පැමිණි විශ්ව විද්‍යාල ශිෂ්‍යාවෝය. රිදීමා තමා දුක පුරුදු තරුණයකු නිතර දකින මුත්, ඔහු කවුදැයි කීමට තරම් මතකයක් ඇයට නැත්තේය. මහීකාගේ පෙම්වතාවන අජයගේ ළඟම මිතුරා දිනූෂ ද රිදීමාට ආදරය කරයි. නිශ්ක නැමැති තරුණයා පිළිබඳව, රිදීමා තුළ ඇත්තේ කෙබඳු හැඟීමක්දැයි යහළුවන් තුළ හටගන්නේ ගැටළුවකි. අවසන මේ රහස විසඳාගැනීම සඳහා සියල්ලෝම ශ්‍රී ලංකාව බලා පිටත්වෙති. මෙහිදී රිදීමා සිය යහළුවන් සමග මේ රහස අනාවරණය කරගැනීම සඳහා වෙහෙසෙන්නීය. දිනක් තම යෙහෙළියන් හා පිංචිද සමග සොල්දරයට යන ඇයට, තමාගේ රුවට සමාන ඡායාරූපයක් බිත්තියේ එල්වා තිබෙනු ඇස ගැසේ. එහිදී සිහිසුන්ව වැටෙනා ඇයට, ඇගේ අතීත කතාව පවසන බවට, එහි පැමිණෙන නදින් අය්යා පොරොන්දු වෙයි.*

*අද එතැන් සිට*

සියල්ලෝම කෑම මේසය වටා වාඩිවී උන්නෝය. මේසය පුරා තැනින් තැන දක්නට ලැබුණේ, ඔවුන් විසින් හිස්කරනා ලද තේ කෝප්පය. මැණිකා විසින් හවස කපා පිළියෙල කරන ලද වැලිතලප පීරිසියේ ඉතිරිවූ කැට දෙක තුනය. ලොකු පළඟානෙහි ඉතිරිවූ පුවාලි කෙසෙල්ගෙඩිය. එයද එක්තරා විදියක සටනක් මහීකා සිතුවාය.

"දැන් අපි බහිමු කතාවට...."

නදින් අය්යා පැවසීය. හැමෝම තම අවධානය ඔහු වෙත යොමු කළෝය. තමාගේ හද ගැහෙනු රිදීමාට ඇසිණි. ඈ මොහොතකට දෑස් පියාගත්තාය. නදින් තම සුරත යවා, තමා අසල ඉඳ උන් නැගෙණියගේ සුරත තදින් අල්වා ගත්තේය.

"රිදීමා...."

ඇය සෙමෙන් ඇස් ඇර ඔහු දෙස බැලුවාය.

"මම අද මෙතන මොන කතාව කීවත් ඔයා මගේම නංගි බව ත්තපරයකටවත් අමතක කරන්න එපා හොඳේ."

රිදීමාගේ මව තම නෙතට නැගුණු කඳුලක් පිස දැමුවාය. මහීකා බිම බලාගත්තාය. අමාගේ නෙත් නම් නදින් වෙතින් මොහොතකටවත් ඉවත් වූයේ නැත.

"රිදීමා මගේ පුංචි අම්මගේ දුවෙක් !..."

හෙණ ගෙඩි හත, අටක් හිසට පාත්වෙනු දැනුණත්, රිදීමාට සිතුණේ තමා මෙය හැමදාම දැනසිටියා නොවේදැයි කියාය.

අම්මා වඩා ආදරය කළේ අය්යාටය. ඇය රිදීමාට කළ ආදරයේ 'අඩුවක් ' තිබුණා නොවේ. එහෙත් යම් වෙනස-ක් තිබුණෝය. ඇය නිතරම රදීමා දෙස බැලුවේ ශෝකයකිනි. එක්තරා අන්දමක පසුතැවිල්ලකිනි.

"අපි ඒ කාලේ කොළඹ පදිංචි වෙලා හිටියේ මෙහේ හිටියේ අපේ මහ උදවිය..." අම්මාගේ හඬ බිඳෙනවා රිදීමාට ඇසුණෝය.
"මගේ නංගි ඉගෙනගත්තේ කොළඹ. එයා හරිම ලස්සනයි. දඟයි. අප්පච්චිගේ ඇස්දෙක උනේ නංගියි..." අම්මා තවත් කඳුලක් පිස දැමුවාය.

අප්පච්චී වචනයක් නොදෙඩුවේය.

"විශ්ව විද්‍යාලයේ ඉන්න කාලෙ නොගැලපෙන සම්බන්දෙකට නංගි පැටලුනා. අප්පච්චී එකපයින් ම කියා හිටියේ, කෑලි කැපුවත් නංගිට ඒ මනුස්සයා එක්ක යන්න දෙන්නෙ නෑ කියලයි. ඒත් නංගිව නවත්තන්න කාටත් බැරි උනා. ඒ දෙන්නා හොරෙන්ම කසාද බැන්දා...."

"මම මුලින්ම කීවා ගෙදර අයගේ කැමැත්තෙන් ඕක පිළිවෙලක් කරන්න කියලා. ගෑනියෙක් බඩදරු උනාට පස්සෙ අහවල් දෙයක් කරන්වද ?" අප්පච්චී පැවසුවේ හැඟීම් විරහිත අයකු ලෙසය.
"ඊට පස්සෙදිවත්, අපි කොච්චර කීවත් අප්පච්චී ඇහුවේ නෑ. අර කොල්ලා රට දාලා ගියා. අප්පච්චී මිය ඇදුනා..."

කිසිවෙක් කතා නොකළෝය.

"නගා දරු දෙන්නෙක් එක්ක තනිවෙච්චි. එයාට හිටියේ නිඹුල්ලු"

රෙහානාගේ සිනහව, රිදීමාගේ මනසෙහි ඇඳී, නොපෙනී ගියේය.

"දෙන්නගෙන් බාල දැරිවි මොකක් නමුත් මොලේ අමාරුවක් තිබුණා. පස්සේ, අපි ඒ දැරිවිත් අරගෙන ගමට ආවා..." අප්පච්චී පැවසීය. මෙතරම් තද හිතක් ඇතැයි තමා සිතූ අප්පච්චී එබන්දක් කරායැයි රිදීමාට අදහාගත නොහැකි වූයේය.
"නංගිටත් ඒ වගේම ප්‍රශ්නයක් තිබුණා. මහත්තයා රට ගියාට පස්සේ එයාටත් ලෙඩේ වැඩි උණා. රිදීමා නුවර කොන්වන්ට් එකට දාන්න අපි තීරණය කළේ එතකොටයි. ඉඳහිට නිවාඩුවකට ඇරෙන්න දුව අපේ ගෙදර වැඩිපුර ආවේ නෑ...."

අම්මා හිස ඔසවා රිදීමා දෙස බැලුවාය.

"මම දන්නවා මේ මුකුත් ඔයාට මතක නැති බව. ඔයා පුංචි සංදියේ ඉඳන් අම්මයි, අප්පච්චීයි කීවේ අපි දෙන්නට. ඔයාගේ අම්මට ඔයා කීවේ පුංචි...."

අම්මාගේ දෙනෙතින් 'සට, සට' ගා කඳුලු කඩා හැලුණෝය. අප්පච්චීද වහා මුහුණ පසෙකට හරවා ගත්තේය.

නිහඬව සිටි නදින් කතාව පටන් ගත්තේය.

"රෙහානා හැම තිස්සේම පෙන්නුම් කළේ එයා, ඔයා කියලයි. එයා ඉගෙන ගන්න දක්ෂ උණේ නෑ. ආසා කළේ නැටුමට විතරයි..."

ගෙජ්ජි සැලෙන හඬද, රෙහානාගේ ගීතමය සිනාහඬද රිදීමාට ඇසී, නෑසී ගියේය.

නදින් අය්යා රිදීමා දෙස බැලීය. 'නිශ්කට ඔය දෙන්නා පැටලුණේ ඒකයි.' දිනූෂට සුසුමක් හෙළිණි. එය සැන-සුම් සුසුමකැයි රිදීමා සිතුවාය.

නිශ්ක කෙරෙහි තදබල බැඳීමක් ඇය තුළ කවදාවත් නොතිබුණෝය. වූයේ කිසියම් අන්දමක සෙනෙහසක් පමණෙකි.

"මේ සිද්ධිය උණේ රිදීමා ගමට ආපු වෙලාක. ගමේ මිනිස්සු කොහොමටත් මේ දෙන්නා පටලවාගෙනයි තිබුණේ."

"සුදු මැණිකේ අද නැටුම් පංතියට යන්නේ නැතැයි..." ගැමි ගැහැනියක අසනවා රිදීමාට මතක් විය.

"මොන නැටුම් ද ?"

"ඇයි අර හැමදාම වගේ හවසට නැටුම් ගුරුන්නා-න්සෙගෙ ගෙදර ගොහුන් ඉගෙන ගන්නේ...."

ගැහැනිය දත්නැති කටඅයා හිනැහුණාය.

"රෙහානා, නිශ්ක එක්ක පැටලුණේ ඔය නැටුම් පංති යන්න ගිහින්." අප්පච්චීගේ හඬෙහි වූයේ කෝපයකි.

"මේ ළමයගේ තත්වය දැනගනත්, නැටුම්කාරයා තමාගේ පුතාට අවවාද කළේ නෑ. මම හිතන්නේ අදටත් අවවාද කරලා නැතිව ඇති..."

"නිශ්ක කියන්නේ අවවාද අහන මිනිහෙක් නෙමේ." නදින් අය්යා පැවසුවේය. එයා මහා හිතුවක්කාර, පන්ඩිත මිනිහෙක්. ඒත් මිනිහා රෙහානට පණ ඇරගෙන ආදරේ කළා. හැබැයි රිදීමයි රෙහානයි දෙන්නෙක් කියලා මිනිහා දැනගෙන හිටියද මම දන්නේ නෑ."

"නිශ්ක ඉස්කෝලේ ගියේ කොහෙද ?" අජය ඇසුවේය.

"මිනිහා ඉස්කෝලේ ගියේ නුවර නෑයෙකුගෙ ගෙදර ඉඳන්. ඒත් හැම නිතරම උන්නේ ගමේ..."

නදින් මොහොතකට නිශ්ශබ්ද වූයේය.

"ඒ මූසල සිද්ධිය උණේ ඔය කියනා නිවාඩුවෙදීයි. රෑ දිගටම මොර සූරන වැස්සක් වැස්සා. ගඟ පිටාර ගැලුවා. පිංචි තමා උදේම නැගිටලා රෙහානා නැති බව දැනගෙන රිදීමත් එක්ක ගං ඉවුරට ගිහින් තිබුණේ !"

මේ කිසිවක් පිංචි කෙල්ල තමාට නොකීවේ මන්දැයි රිදීමා කල්පනා කළාය. තමාගේ මනසේ මැවුණු දෙබස සිදුවූයේ රෙහානා හා නිශ්ක අතර නොවේද ? තමා සිතුවේ ඒ දෙබස වූයේ තමා හා නිශ්ක අතර කියා නේද ? රිදීමා මේසය මත හිස ගසාගත්තාය. රෙහානා වතුරට වැටෙනු, තමා කෑගසනු හා මහා ජල කඳ මැදට වැටී ගසාගෙන යනු ඇගේ මතකය පුරා දිව යන්නට විය.

තමාගේ කෑගෑම නිසා ඒ දෙසට පීනා ආ නිශ්ක රෙහානා වෙනුවට බේරාගත්තේ තමා නොවේද ? අහිංසක රෙහානා ඒ ජලකඳ මැදට ගසාගෙන ගොස් අතුරුදහන් වූවාද ? ඇය මිය ගියාද ? ඇගේ සිරුර මොවුන් විසින් සොයාගනු ලැබුවාද ?

රිදීමා කෑ ගසමින් නැගිට්ටාය.

"රෙහානා.... රෙහානා...."

නදින් හා අමා ඇය වත්තම් කොට ගත්තෝය.

"දැන් ඒ හැමදේම වෙලා සෑහෙන කල්..." නදින් හෙමිහිට පැවසුවේය.

"ඔයාගේ මතකය එන්න, එන්න වැඩිවෙයි. දැන් ඔයාට බයවෙන්න දෙයක් නෑ. ඒකෙන් වද විඳින්න දේකුත් නෑ...." අමාද පැවසුවාය.

"අපි ඉක්මනට රිදීමව කොළඹ ගෙනිච්චා. මේ අනතුරෙන් පස්සේ එයාගේ මතකය නැතිඋණු එක ගැන අපි එක අතකින් සතුටු උණා." අම්මා ඔසරි පොටෙන් දෑස පිසදා ගත්තාය.

"මොනවාද හරියට උණේ කියන එක ගමේ අයටවත් හරියට තේරුණේ නෑ..."

"මොනවද උණේ කියල මටවත් තාම තේරෙන්නේ නෑ..." නදින් ද පැවසීය.

"දැන් කෝ රිදීමාගේ අම්මා ?" මහීකා ප්‍රශ්ණ කළාය.

මේසය වටා යළිදු නිහැඬියාවක් පැතිර ගියේය. නැවත තම අසුනෙහි හිඳගත් රිදීමා කඳුළු වැගිරෙන දෑස නදින් අය්යා වෙත යොමු කළාය.

"එයා ඉන්නවා කොළඹ පුද්ගලික රෝහලක. දැන් එයාට තරමක් සුවයි."

"එතකොට එයාගේ අප්පච්චි ?"

"එයාට අපි ලියුම් යැව්වා. බාගදා මිනහා ආපහු ඒවි..." නදින් පැවසීය.

"මොනතරම් දුක හිතෙන කතාවක් ද ?" අජය පැවසුවේය. "ආදරෙන් බැඳුණු දෙන්නෙකුට එක්වෙන්න නොදෙන එක කොච්චර හානිකර දෙයක්ද කියලා දැන් ජේනවා නේද ?"

"ඒක නම් ඇත්ත !" අමා පැවසුවාය.

"ඒ දෙන්නම උගත්තු. අපූරු දරු දෙන්නෙකුත් හිටියා. දැන් හිටියා නම් ලස්සණ පවුලක්" අම්මා සුසුම් හෙලුවාය.

රිදීමා අසන්නට ගිය ප්‍රශ්ණය වැටහුණාක් මෙන් ඇගේ දෙනෙත් රිදීමා දෙස යොමු වූයේය.

"අපි නිශ්කට අකමැති උණේ, කුල ප්‍රශ්ණයකටවත්, මුදල් ප්‍රශ්ණයක් හන්දා නිසාවත් නෙවි. රෙහානගේ අසනීපේ නිසා. එයා විවාහයක් කරගෙන, දරුවන් හදන මානසික මට්ටමක උන්නු කෙනෙක් නෙවි... නිශ්ක එයාට කොච්චර ආදරේ කළත්, ආදරෙන් විතරක් පවුලක් රැකෙන්නේ නෑ. දෙපැත්තෙන්ම සහයෝගය නොලැබුණොත් ඒ ආදරේ කොයි මො-හොතක හරි දෙදරලා යනවා. රිදීමගේ අම්මට උණොත් ඒ දේමයි. ඒක දැන, දැන අපි රෙහානටත් ඒ දේම කරන්නේ කොහොමද ?"

"ඒක නම් ඇත්ත...." අමා එකඟ වූවාය. "නැති ප්‍රශ්ණ ගොඩක් ඇතිවෙනවා මිසක් ඇති ප්‍රශ්ණ වල විසඳීමක් වෙන්නේ නෑ...."

"දැන් ඉතින් රිදීමට තියෙන්නේ අමම්ව බලලා ඇවිත් ඔයාගේ ඉගෙනීමේ වැඩ ඉවර කරගන්න..." අජය පැවසුවේය. "දැන් ඉතින් ලොකු ප්‍රශ්ණයක් විසඳුණානේ..."

"ඒකහරි" මහීකා එකඟවූවාය.

"ඒත් ඉතින් තවත් කෙනෙකුටත් ඔය කතාව පැහැදිලි කරන්න වෙනවා නේද ?"

"ඒ කවුද ?" දිනූෂ ඇසීය.

"ඇයි නිශ්ක ....." මහීකා කීවාය.



ළඟම කළාපයට